සැ. යු. -2008.07.11 දින පළ වූ අංක 1,558 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,559 - 2008 ජූලි මස 18 වැනි සිකුරාදා - 2008.07.18

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 720 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 720 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | 721 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| ආණ්ඩුවේ නිවේදන ... ... ... | 772 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 725 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මීත් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු ගැසට් නිවේදන භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම්, පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙන සේ සකස් කරන මෙන් සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මීත් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර - එනම් 2008 ජූලි මස 25 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යා යුතු දැන්වීම් 2008 ජූලි මස 11 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2008 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2008 අංක 372

**ජාතික ශිෂ්‍යභට බලකාය**

**අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද නිල උසස් කිරීම්**

(අ) 2007 දෙසැම්බර් මස 31 වැනි දින සිට තාවකාලික කපිතන් වශයෙන්

නි/5804 ලුතිතන් ඩබ් එල් පී විජේසුන්දර
නි/5926 ලුතිතන් එම් ආර් පී මායාදුන්නේ

(ආ) 2008 ජූලි මස 20 වැනි දින සිට තාවකාලික කපිතන් වශයෙන්

නි/4705 ලුතිතන් ඩබ් එම් එම් ප්‍රේමරත්න
නි/4824 ලුතිතන් කේ එම් ජී සමරකෝන්
නි/5224 ලුතිතන් ජේ ඒ සී ජයසිංහ
නි/5238 ලුතිතන් ජී එච් නන්දසිරි
නි/5267 ලුතිතන් එස් ඩබ් එස් අමරසිංහ
නි/5695 ලුතිතන් එම් එම් පී බී මොහොට්ටි
නි/5703 ලුතිතන් එච් පී ඩී එස් කේ විජේතුංග
නි/5763 ලුතිතන් ආර් පී කේ ටී සන්දනායක
නි/5779 ලුතිතන් ආර් එච් එන් පී රත්නවීර
නි/5782 ලුතිතන් කේ ජී ඒ එස් කැප්පෙටිමුදුනගේ
නි/5785 ලුතිතන් එල් එන් සමන්සිරි
නි/5911 ලුතිතන් ඒ එම් කුලතුංග
නි/5924 ලුතිතන් ඒ එම් ඩී අධිකාරි

අතිගරු ජනාධිපතිතුමන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 ජූනි මස 30 වැනි දින,
කොළඹ දී ය.

07-411

2008 අංක 373

**ජාතික ශිෂ්‍යභට බලකාය**

**අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද නිල උසස් කිරීම්**

(අ) 2007 ඔක්තෝබර් මස 01 වෙනි දින සිට ලුතිතන් වශයෙන්

නි/5354 2/ලුතිතන් එන් එම් යූ ඩී බී නවරත්න

(ආ) 2008 මැයි මස 15 වැනි දින සිට ලුතිතන් වශයෙන්

නි/5784 2/ලුතිතන් ඒ එම් ඒ සෙනෙවිරත්න
නි/6057 2/ලුතිතන් ඒ ඩී ප්‍රියදර්ශණ
නි/6243 2/ලුතිතන් කේ ඒ ආර් රූපසිංහ
නි/6293 2/ලුතිතන් කේ අයි මුණසිංහ (ගැ)
නි/6295 2/ලුතිතන් අයි කේ එම් ආර් ඉනිමංකඩ
නි/6297 2/ලුතිතන් කේ විජේගුණවර්ධන
නි/6298 2/ලුතිතන් ඩී ඩී පී පීරිස්
නි/6300 2/ලුතිතන් ඩබ් ඒ එම් එස් සෙනෙවිරත්න
නි/6302 2/ලුතිතන් පී කේ ජී සී දේශප්‍රිය
නි/6315 2/ලුතිතන් වී වී අයි ආර් කේ බොළුකඳුරගේ
නි/6318 2/ලුතිතන් සී සමරනායක

අතිගරු ජනාධිපතිතුමන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 ජූනි මස 30 වැනි දින,
කොළඹ දී ය.

07-410

# අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය

2008 අංක 374

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන පන්තියේ, වී. පී. කේ. අනුෂ පැල්පිට මහතා 2007 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වශයෙන්.

07-423

2008 අංක 375

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන පන්තියේ, ආචාර්ය ආර්. එච්. එස්. සමරතුංග මහතා 2008 පෙබරවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයෙකු වශයෙන්.

07-422

# වෙනත් පත්කිරීම් ආදිය

2008 අංක 376

## ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පත් කිරීම්

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I පන්තියේ ටී. බී. වික්‍රමසිංහ මහතා 2007.12.17 දින සිට නැවත නියමයක් කරන තුරු පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ වශයෙන්

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I පන්තියේ පී. ඩබ්ලිව්. රාජපක්ෂ මහත්මිය 2008.01.01 දින සිට නැවත නියමයක් කරන තුරු සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු කොමසාරිස් (පාලන) වශයෙන්

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I පන්තියේ ඩබ්ලිව්. එම්. දයාවතී මහත්මිය 2008.01.21 දින සිට නැවත නියමයක් කරන තුරු කම්කරු සබඳතා සහ මිනිස්බල අමාත්‍යාංශයේ කම්කරු කොමසාරිස් වශයෙන්

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I පන්තියේ ඩබ්ලිව්. එම්. ජී. ඒ. බණ්ඩාර මහතා 2008.04.21 දින සිට නැවත නියමයක් කරන තුරු ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (පරිපාලන) වශයෙන්

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III පන්තියේ සී. සී. ජයසිංහ මහතා 2007.01.01 දින සිට නැවත නියමයක් කරන තුරු බස්නාහිර පළාත් සභාවේ කොළඹ මහ නගර සභාවේ සහකාර ලේකම් වශයෙන්

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III පන්තියේ ආර්. පී. ආර්. රණසිංහ මහත්මිය 2007.12.10 දින සිට නැවත නියමයක් කරන තුරු විශේෂ ව්‍යාපෘති අමාත්‍යාංශයේ සහකාර ලේකම් වශයෙන්

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III පන්තියේ ඒ. වී. වී. දමයන්ති මහත්මිය 2007.12.10 දින සිට නැවත නියමයක් කරන තුරු පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ සහකාර ලේකම් වශයෙන්

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III පන්තියේ බී. වී. මංගලිකා මහත්මිය 2007.12.11 දින සිට නැවත නියමයක් කරන තුරු ජාතික පොලිස් කොමිෂන් සභාවේ සහකාර ලේකම් වශයෙන්

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III පන්තියේ එස්. එම්. එම්. විජිතා මායාදුන්න මහත්මිය 2007.12.11 දින සිට නැවත නියමයන් කරන තුරු අභ්‍යන්තර පරිපාලන අමාත්‍යාංශයේ සහකාර ලේකම් වශයෙන්

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III පන්තියේ ඩබ්ලිව්. ඩබ්ලිව්. කේ. ජේ. ප්‍රනාන්දු මහතා 2007.12.11 දින සිට නැවත නියමයක් කරන තුරු ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ හිමිකම් නිරවුල් කිරීමේ සහකාර කොමසාරිස් වශයෙන්

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III පන්තියේ ඒ. ඒ. ඩී. එස්. අතපත්තු මහත්මිය 2007.12.11 දින සිට නැවත නියමයක් කරන තුරු රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සහකාර ලේකම් වශයෙන්

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III පන්තියේ කේ. එම්. පී. ඩී. ජයම්පති මහතා 2007.12.11 දින සිට නැවත නියමයක් කරන තුරු රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සහකාර ලේකම් වශයෙන්

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III පන්තියේ එම්. එම්. එන්. දිනිප්‍රිය මහතා 2007.12.11 දින සිට නැවත නියමයක් කරන තුරු මැතිවරණ දෙපාර්තමේන්තුවේ සහකාර මැතිවරණ කොමසාරිස් වශයෙන්

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III පන්තියේ එස්. සුදාකරන් මහතා 2007.12.11 දින සිට නැවත නියමයක් කරන තුරු මැතිවරණ දෙපාර්තමේන්තුවේ සහකාර මැතිවරණ කොමසාරිස් වශයෙන්

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III පන්තියේ වී. උමාමගල් මෙනවිය 2007.12.12 දින සිට නැවත නියමයක් කරන තුරු කම්කරු සබඳතා සහ මිනිස්බල අමාත්‍යාංශයේ සහකාර කම්කරු කොමසාරිස්වරියක වශයෙන්

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III පන්තියේ කේ. ඒ. එම්. එල්. සී. කුලතිලක මහත්මිය 2007.12.12 දින සිට නැවත නියමයක් කරන තුරු ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ හිමිකම් නිරවුල් කිරීමේ සහකාර කොමසාරිස්වරියක වශයෙන්

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III පන්තියේ පී. එල්. පත්මකුමාර මහතා 2007.12.17 දින සිට නැවත නියමයක් කරන තුරු ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ සහකාර පාලක වශයෙන්

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III පන්තියේ එස්. ඩී. ලියනගේ මහත්මිය 2007.12.26 දින සිට නැවත නියමයක් කරන තුරු ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ සහකාර පාලක වශයෙන්

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III පන්තියේ ජී. පී. සපුතන්ත්‍රී මහතා 2008.01.01 දින සිට නැවත නියමයක් කරන තුරු ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ සහකාර පාලක වශයෙන්

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III පන්තියේ ජේ. කේ. බෝගහවත්ත මහත්මිය 2008.01.02 දින සිට නැවත නියමයක් කරන තුරු කම්කරු සබඳතා සහ මිනිස්බල අමාත්‍යාංශයේ සහකාර කම්කරු කොමසාරිස්වරියක වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III පන්තියේ ටී. ටී. උපුල්මලී මහත්මිය 2008.01.07 දින සිට නැවත නියමයක් කරන තුරු අග්‍රාමාත්‍ය කාර්යාලයේ සහකාර ලේකම් වශයෙන්

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III පන්තියේ ඒ. එන්. ආර්. වීරසේකර මහත්මිය 2008.02.01 දින සිට නැවත නියමයක් කරන තුරු රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සහකාර ලේකම් වශයෙන්

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III පන්තියේ පී. සී. දෙනගම මෙනවිය 2008.03.11 දින සිට නැවත නියමයක් කරන තුරු ප්‍රවාහන අමාත්‍යාංශයේ සහකාර ලේකම් වශයෙන්

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III පන්තියේ ඩබ්ලිව්. ඒ. සී. වික්‍රමතිලක මහත්මිය 2008.05.15 දින සිට නැවත නියමයක් කරන තුරු රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සහකාර ලේකම් වශයෙන්.

ඩී. දිසානායක,
ලේකම්,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

2008 ජූනි මස 26 වැනි දින,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

07-373

# ආණ්ඩුවේ නිවේදන

අංකය : ප්‍ර. නො. 11/2/35/08/2008 පිටු/සැ.

## ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥා පනත

01. මෙහි පහත උපලේඛනයෙහි දෙවෙනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වන තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමු වන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥා පනතේ 4 වන වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2008.07.19 වෙනි දින සිට 2008.08.04 වෙනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ. ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂා කර බැලිය හැක.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම් කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධතාවය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමඟ 2008.08.11 දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

### උපලේඛනය

| *ලියාපදිංචි කළ පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ''එම්'' දරන කොට්ඨාසයේ 2131 වෙළුමේ 155 දරන පත් ඉරුව | බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ මහරගම, ගොඩිගමුව ගමේ පිහිටි අක්. 0, රූ. 0, පර්. 10.54ක් විශාලත්වයෙන් යුත් බටදොඹගහවත්ත හෙවත් කහටගහවත්ත නැමැති ඉඩමේ සී. එම්. තාජුඩීන් මානක තැන විසින් 1993.06.07 දින මැන සාදන ලද අංක 32/93 දරන පිඹුරේ ප්‍රකාර ලොට් 1ඒ 4 දරන කොටසට මායිම්,<br>උතුරට : ලොට් 1 ඒ 1<br>නැගෙනහිරට : දෙහිවල පාර<br>දකුණට : ලොට් 1 එම්<br>බස්නාහිරට : ලොට් 1 ඒ 2 | 1. ජී. ද අල්විස් ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් 1996.02.27 දින ලියා සහතික කරන ලද අංක 356 දරන උකස්කර ඔප්පුව<br>2. ඒ. වලිසුන්දර ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් 1998.10.15 දින ලියා සහතික කරන ලද අංක 1326 දරන විකුණුම්කර ඔප්පුව.<br>3. එච්. එන්. එස්. හඳුන්නෙත්ති ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් 1998.11.17 දින ලියා සහතික කරන ලද අංක 1257 දරන බදු ඔප්පුව. |

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය.

රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය,
අංක 243/A3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

07-270

---

අංකය : ප්‍ර. නො. 11/2/35/02/2008 පිටු/සැ.

## ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥා පනත

01. මෙහි පහත උපලේඛනයෙහි දෙවෙනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වන තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමු වන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥා පනතේ 4 වන වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2008.07.19 වෙනි දින සිට 2008.08.04 වෙනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ. ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂා කර බැලිය හැක.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම් කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධතාවය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2008.08.11 දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

**උපලේඛනය**

| *ලියාපදිංචි කළ පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ "එම්" දරන කොට්ඨාසයේ 347 වෙළුමේ 178 දරන පත් ඉරුව | බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ මොරටුවේ ලක්ෂපතිය යන ගමේ පිහිටි අක්. 0, රූ. 0, පර්. 34ක් විශාලත්වයෙන් යුත් වරිපනම් අංක බී 463 දරණ අමුහකුප්ජාවත්ත බෙදූ 2/3 කොටස දරන ඉඩමට සී. පී. ද සිල්වා මානක තැනගේ 1913.11.05 දින අංක 3004 පිඹුරේ ප්‍රකාර මායිම් උතුරට : ඒබ්‍රහම් ප්‍රනාන්දු සහ තවත් අය අයිතිකම් කියන ඉඩම ද, නැගෙනහිරට : ස්ටීවන් මැන්ඩිස් අයිතිකම් කියන ඉඩම ද, දකුණට : අයිසෙක් ප්‍රනාන්දු අයිතිකම් කියන ඉඩම ද, බස්නාහිරට : එම්. ප්‍රනාන්දු අයිතිවාසිකම් කියන ඉඩම හා කරත්ත පාර | 1. ආර්. ඩබ්. පෙරේරා ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1934.04.25 දින ලියා සහිතක කරන ලද අංක 1260 දරන විකුණුම් ඔප්පුව<br>2. කාන්ති ෆොන්සේකා ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1980.03.31 දින ලියා සහතික කරන ලද අංක 142 දරන විකුණුම්කර ඔප්පුව<br>3. ආර්. ඒ. පියදාස ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1981.09.20 දින ලියා සහතික කරන ලද අංක 494 දරන තෑගි ඔප්පුව |

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය.

රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය,
243/A3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

07-271

---

අංකය ප්‍ර. නො. 11/2/35/05/2008 පිටු/සැ

**ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත**

01. මෙහි පහත උපලේඛනයෙහි දෙවැනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වන තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමු වැනි තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥා පනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2008.07.19 වැනි දින සිට 2008.08.04 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ. ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේදී පරීක්ෂා කර බැලිය හැක.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම් කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධතාවය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2008.08.11 දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

### උපලේඛනය

| *ලියාපදිංචි කළ පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ''එම්'' දරන කොට්ඨාසයේ 2633 වෙළුමේ 235 දරන පත් ඉරුව. | බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ ශ්‍රී ජයවර්ධන පුර-කෝට්ටේ නගර සභා සීමාව තුළ නාවල යන ගම පිහිටි අ : 0, රූ. : 0, පර්. 25ක් විශාලත්වයෙන් යුත් ''වෙල්වැටිය ඕවිට නොහොත් බක්මීගහ කුඹුර'' නැමැති ඉඩමේ එම්. එල්. එන්. පෙරේරා මානක තැන විසින් 2004.05.19 දින මැන සාදන ලද කැබලි අංක 2592 දරන පිඹුරේ ප්‍රකාර ලොට් සී 1 දරන කොටසට මායිම්<br>උතුරට : අංක 2592 පිඹුරේ ලොට් සී 3 දරන කොටස<br>නැගෙනහිරට: අංක 2592 පිඹුරේ ලොට් සී 3 දරන කොටස<br>දකුණට : ලුවිස් බොතේජු, විලියම් බොතේජු, සහ බී පෙරේරාට අයිති දෙනවත්සේ කුඹුර.<br>බස්නාහිරට : ලොට් 20 ප්ලෑන් අංක 433 | ඒ. එච්. ටී. දයානන්ද ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් 2004 මැයි 28 දින ලියා සහතික කරන ලද අංක 1682 දරන විකුණුම් ඔප්පුව<br><br>ඩී රණසිංහ ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් 2006.05.02 දින ලියා සහතික කරන ලද අංක 898 දරන විකුණුම් ඔප්පුව. |

### උපලේඛනය

| | | |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ''එම්'' දරන කොට්ඨාසයේ 2633 වෙළුමේ 236 දරන පත් ඉරුව. | බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ ශ්‍රී ජයවර්ධන පුර-කෝට්ටේ නගර සභා සීමාව තුළ නාවල යන ගම පිහිටි අ : 1, රූ. : 3, පර්. 07.30ක් විශාලත්වයෙන් යුත් ''වෙල්වැටිය ඕවිට නොහොත් බක්මීගහ කුඹුර'' නැමැති ඉඩමේ එම්. එල්. එන්. පෙරේරා මානක තැන විසින් 2004.05.19 දින මැන සාදන ලද කැබලි අංක 2592 දරන පිඹුරේ ප්‍රකාර ලොට් සී 2 දරන කොටසට මායිම්<br>උතුරට : ගොරකගහකුඹුර<br>නැගෙනහිරට : ජුවානා ගඟ<br>දකුණට : ලුවිස් බොතේජු, විලියම් බොතේජු, සහ බී පෙරේරාට අයිති දෙනවත්සේ කුඹුර. සහ ලොට් සී<br>බස්නාහිරට : 2592 පිඹුරේ ලොට් සී 1 සහ සී 3 සහ 433 පිඹුරේ ලොට් 21. | ඒ. එච්. ටී. දයානන්ද ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් 2004 මැයි 25 දින ලියා සහතික කරන ලද අංක 1682 දරන විකුණුම්කර ඔප්පුව.<br><br>ඩී රණසිංහ ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් 2006.05.02 දින ලියා සහතික කරන ලද අංක 898 දරන විකුණුම් ඔප්පුව. |

### උපලේඛනය

| | | |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ''එම්'' දරන කොට්ඨාසයේ 2633 වෙළුමේ 237 දරන පත් ඉරුව. | බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ ශ්‍රී ජයවර්ධන පුර-කෝට්ටේ නගර සභා සීමාව තුළ නාවල යන ගම පිහිටි අ : 0, රූ. : 0, පර්. 7.70ක් විශාලත්වයෙන් යුත් ''වෙල්වැටිය ඕවිට නොහොත් බක්මීගහ කුඹුර'' නැමැති ඉඩමේ එම්. එල්. එන්. පෙරේරා මානක තැන විසින් 2004.05.19 දින මැන සාදන ලද කැබලි අංක 2592 දරන පිඹුරේ ප්‍රකාර ලොට් සී 3 දරන කොටසට මායිම්<br>උතුරට : ලොට් සී 2 ප්ලෑන් අංක 2592<br>නැගෙනහිරට : ලොට් සී 2 ප්ලෑන් අංක 2592<br>දකුණට : ලොට් සී 1 ප්ලෑන් අංක 2592<br>බස්නාහිරට : ලොට් 5 ප්ලෑන් අංක 433 (පාර) | ඒ. එච්. ටී. දයානන්ද ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් 2004 මැයි 28 දින ලියා සහතික කරන ලද අංක 1682 දරන විකුණුම්කර ඔප්පුව.<br><br>ජේ. ලියනගේ ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් 2004.11.05 දින ලියා සහතික කරන ලද අංක 2149 දරන විකුණුම්කර ඔප්පුව.<br><br>ඩී. රණසිංහ ප්‍රසිද්ධ නොතාරිස තැන විසින් 2006.05.02 දින ලියා සහතික කරන ලද අංක 898 දරන විකුණුම්කර ඔප්පුව. |

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය,
අංක 243/ඒ3 ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

07-272

**වන්දනා ගමන් ආඥා පනත ශ්‍රී මාමාංශ පිල්ලයාර් කෝවිල් වාර්ෂික උත්සවය - 2008 - මඩකලපුව දිස්ත්‍රික්කය**

යථෝක්ත උත්සවය 2008 ජූලි මස 23 වැනි දින පටන් ගෙන 2008 අගෝස්තු මස 01 වැනි දින දක්වා පවත්වනු ලබන බව මෙහි උත්සවයට වන්දනා සඳහා පැමිණෙන අයගේ සහ අනෙකුත් සියලු දෙනාගේම දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශ කරමි.

1948.07.16 වැනි දින අංක 9886 දරන ආණ්ඩුවේ *ගැසට්* නිවේදනය සඳහන් නිත්‍ය නියෝගයක් කෙරෙහි මෙම උත්සව සමයේදී එකී උත්සවයට පැමිණෙන සියල්ලන්ගෙන් හා අනෙකුත් අයගෙන් අවධානය මෙයින් යොමු කරවමි.

කේ. පද්මරාජා මිය,
ප්‍රාදේශීය ලේකම්,
මන්මුනේ උතුර, මඩකලපුව.

07-371

---

**වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

මහඑළිය ව්‍යාපාරයේ මහකන්න රැස්වීම් වාර්තාව - 2007/2008

වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මහඑලිය ව්‍යාපාරයේ 2007/2008 යල කන්නය සඳහා කන්න රැස්වීම 2008.06.03 වැනි දින පවත්වන ලදී. එහිදී පහත තීරණ ගන්නා ලදී.

1. මුළු වගා බිම් ප්‍රමාණය අක්කර 540කි.
2. වගා කරන මුළු බිම් ප්‍රමාණය අක්කර 540 කි.
   අර්තාපල් අක්කර 350 කි.
   මිශ්‍ර එළවළු අක්කර 190 කි.
3. ඇලවේලි සුද්ද කිරීම අවසන් දිනය 2008.06.17
4. ජලය නිකුත් කිරීමේ ආරම්භක දිනය 2008.06.19
5. ජලය නිකුත් කිරීමේ අවසන් දිනය 2008.11.15
6. තවාන් දැමීම හා බෝග වගා කරන අවසන් දිනය 2008.07.31
7. අස්වැන්න නෙලා අවසන් කළ යුතු දිනය- 2008.11.30
9. ඇලවේලි සුද්ධ නොකරන්නන් සඳහා දඩ මුදල ලෙස පැලකට රු. 500ක මුදලක් තීරණය කරන ලද අතර ප්‍රධාන ඇල මාර්ගයට සම්බන්ධ ගොඩ ඉඩම් සඳහා ජලය ලබාගන්නා අය සඳහා ද අක්කර 1/4 සඳහා එම දඩ මුදල එනම් රු. 500ක් තීරණය විය.
10. ප්‍රධාන ඇල මාර්ගයට දැනට සම්බන්ධ කර ඇති ජලනල හැර මින් ඉදිරියට කිසිම ජලනලයක් යෙදීමට අවසර නොදෙන්නට තීරණය විය. ප්‍රධාන ඇලේ ඉහල කොටසේ අනවසර වක්කඩ සෑදීම නතර කිරීමට යෝජනා විය.
11. කෙත් ඇල හා ප්‍රධාන ඇලෙහි විනාශ කර ඇති රක්ෂිත කොටස් නැවත පිළිසකර කරවීමට තීරණය විය.

ප්‍රාදේශීය ලේකම්,
වැලිමඩ.

2008.06.26 වෙනි දින,
වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07-438

---

**කඹුරුපිටිය සපුගොඩ ඇසළ උත්සවය - 2008**

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, කඹුරුපිටිය සපුගොඩ ඉලංගන්ගොඩ පුරාණ විහාරස්ථානයේ (සපුගොඩ විද්‍යානිකේත පිරිවෙන) 2008 වාර්ෂික ඇසළ උත්සවය 2008 ජූලි මස 11 වැනි දින සිට 17 වැනි දින දක්වා පවත්වනු ලබන බව වන්දනා ගමන් ආඥාපනත (175 පරිච්ඡේදයේ) යටතේ 1984 ජූලි මස 27 නිකුත් කරන ලද අංක 308 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද රෙගුලාසි අනුව මෙයින් දන්වමි.

මහේෂ් කරුණානායක,
ප්‍රාදේශීය ලේකම්,
කඹුරුපිටිය.

2008 ජුනි මස 25 දින,
කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07-372

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. - නිට්ටඹුව ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබූ යෝජනා සම්මුතිය

2008ක් වූ මැයි මස 22 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් එස්. ජේ. අතපත්තු විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. නමට ලියන ලද්දාවූ 1994.04.08, 1999.08.12 සහ 2004.04.28 දින හා පිළිවෙලින් අංක 5709, 7946 සහ 9217 දරන බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල ගෙවීම පුංචිහේවා අදිකාරිගේ නිමල් චන්ද්‍රසිරි යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හාරලක්ෂ හතලිස්දහස් හත්සිය විස්සයි ශත තිස්අට (රු. 4,40,720.38)ක මුදලක් 2008.03.01 වැනි දින වන විට හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. හි අයවිය යුතු සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 4,40,720.38ක මුදලට 2008.04.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොලිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් හා වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන්ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩු කොට එකී අංක 5709, 7946 සහ 9217 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. වෙත උකස් කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දෙසිකරු ආර්. එස්. මහානාම මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, (මීගමුව ලියාපදිංචි කොට්ඨාශයේ) ගම්පහ දිස්ත්‍රික්කයේ, හාපිටිගම් කෝරළේ, යටිගහ පත්තුවේ, කිතුල්වල, අඹගහවත්ත සහ අඹගහවත්තේ කොටස සහ කහටගහවත්ත දරන ඉඩමට බලයලත් මානක කේ. ඒ. ජී. අමරසිංහ විසින් මැන සාදන ලද 1992.10.17 දින සහ පිඹුරු අංක 6388හි ලොට් අංක ඒ සහ බී හි උතුරට : එම්. පී. සුමනදාසට අයිති ඉඩමෙන් ද, නැගෙනහිරට : පී. පී. ලැපිට සහ පුංචිරාළට අයිති ඉඩම් වලින් ද, දකුණට : එල්. පී. අඹදූවට අයිති ඉඩමෙන් ද සහ බස්නාහිරට : ලොට් අංක 4සී (අඩි 10ක් වෙන්කල කොටස)න් ද මායිම් වූ පර්චස් තිස්පහයි දශම හතර (අ. 0, රූ. 0, පර්. 35.4)ක් විශාල ඉඩම සහ සියළු දේත් සමග මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 257/167 යටතේ ලියාපදිංචි වී ඇත.

මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රාණි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

07-469/6

---

### හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - බණ්ඩාරවෙල ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2008ක් වූ මැයි මස 22 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සීහි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

බණ්ඩාරවෙල ප්‍රසිද්ධ නොතාරිස් එච්. රාජපක්ෂ විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියන ලද්දාවූ ද, 2006.05.04 දින හා අංක 323 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම දොන් බුද්ධික නදීෂාන් මධුෂංක අමරසේකර ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් තුන්ලක්ෂ එකොලොස්දහස් දෙසිය දාහතරයි ශත අනූපහ (රු. 3,11,214.95)ක මුදලක් 2007.08.31 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පීඑල්සීට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 3,11,214.95ක මුදලට 2007.09.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිපුර පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් හා වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන්ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩු කොට එකී අංක 323 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස් කොට ඇත්තාවූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දෙසිකරු අයි. ඩබ්. ජයසූරිය මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, හපුතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, මහපළාත කෝරළේ, කඳුරුගමුව ගමෙහි පිහිටි ''ගොඩවත්ත හෙවත් හෙලමුල්ලේහේන'' නමැති ඉඩමට බලයලත් මානක එම්. කේ. සී. ප්‍රේමචන්ද්‍ර විසින් මැන සාදන ලද 1995.11.10 දිනැති අංක 3561 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 1 ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට : පාරෙන් ද, (ගම් සභා), නැගෙනහිරට : පිඹුරු අංක 3561ට අයත් ලොට් 11න් ද, දකුණට : පිඹුරු අංක 3561ට අයත් ලොට් 2න් ද, සහ බස්නාහිරට : ආර්. එම්. සිරිපාල හිමිකම් කියන ගෙවත්තෙන් මායිම් වූ එකී අංක 3561 දරන පිඹුර ප්‍රකාරව පර්චස් පහළොව (අ. 0. රූ. 0, පර්. 15)ක විශාල ඉඩම සහ එහි පිහිටි සියළු දේත් වන මෙය බදුල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජේ 165/23හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රාණි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

07-469/3

---

### හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - කුරුණෑගල ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබූ යෝජනා සම්මුතිය

2008ක් වූ මැයි මස 22 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් එස්. එස්. හේවාපතිරණ විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියන ලද්දාවූ 2004.08.20 දින හා අංක 796 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල ගෙවීම රාජසිංහ බඩල්ගෙදර රන්ජිත් දේවසුන්දර යන අය ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හාරලක්ෂ අනූදෙදහස් දෙසිය විසිහතයි ශත පනස්පහ (රු. 4,92,227.55)ක මුදලක් 2008.01.31 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පීඑල්සීට අයවිය යුතු සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 4,92,227.55ක මුදලට 2008.02.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිපුර පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් හා වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන්ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩු කොට එකී අංක 796 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස් කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දෙසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්තත්‍රික්කයේ, වෙව්ද විල්ලි හත්පත්තුවේ, තිරගන්දහා කෝරළේ, වෙලන්ගොල්ල ගමේ, ''වෙලන්ගොල්ල වත්ත''

නමැති ඉඩමට බලයලත් මානක එච්. එම්. කරුණාරත්න විසින් 1987.02.28 වැනි දින මැන සාදන ලද පිඹුරු අංක කේයූ/1406 දරන ඉඩමේ ලොට් අංක 162හි උතුරට ; ලොට් 163න් ද, නැගෙනහිරට ; ලොට් 163න් ද, දකුණට ; ලොට් 194න් ද, බටහිරට ; ලොට් අංක 161න් ද මායිම් වූ හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි හතරයි බිංදුව 0.040ක් විශාලත්වය ඇති ඉඩම කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ1183/166 යටතේ ලියාපදිංචි කර ඇත. ඉහත පිඹුරේ ලොට් 8, 20, 22, 35, 39, 52,55, 59,69, 77, 87, 90. 100, 105, 111, 123, 124, 129, 137, 147, 157, 163, 167, 173, 177, 182, 188, 299, 207, 208, 209, 218, 228, 246, 249, 255, 259, 264, 269. 279, 284, 291, 301, 305, 325, 328, 330, 333, 341, 358, 363, 354, 366හි මාර්ග අයිතියද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රාණි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

07-469/1

---

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - කොල්ලුපිටිය ශාඛාව
(කළින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබූ යෝජනා සම්මුතිය

2008ක් වූ මැයි මස 22 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. රාජනාතන් විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියන ලද්දාවූ 2005.07.07 දින හා අංක 1560 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ගම්පලවඩුගේ ගීතාල් අනුර ෆොන්සේකා, සම්පතවඩුගේ ට්‍රිසිලා රුවනි ෆොන්සේකා සහ ගම්පලවඩුගේ ප්‍රමුක් ගීතක රුමේෂ් ෆොන්සේකා යන අය ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හත්ලක්ෂ අනූහයදහස් තුන්සිය තිස්එකයි ශත හැටහත (රු. 7,96,331.67)ක මුදලක් 2008.01.04 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අයවිය යුතු සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 7,96,331.67ක මුදලට 2008.01.05 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් හා වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන්ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩු කොට එකී අංක 1560 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස් කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දෙසිකරු ආර්. එස්. මහානාම මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මොරටුව නගර සභා සීමාවෙහි රාවතාවත්තෙහි පිහිටි ධර්මරත්න ඇවනියු, වරිපනම් අංක 12/2 (කොටස) දරන ගොඩනැගිලි, පස්, ගහකොළ, වැවිලි සහ අනෙකුත් සියලුම දේත් අයත්ව ඇති "බුළුගහවත්ත" නමැති ඉඩමට බලයලත් මානක ඩබ්. ඕ. ජේ. ප්‍රනාන්දු විසින් මැන සාදන ලද 1994.06.11 දිනැති අංක 3775/බී1 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් බී1 ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට ; වරිපනම් අංක 6/1 දරන පරිශ්‍රයෙන් ද, නැගෙනහිරට ; වරිපනම් අංක 12/2 දරන පරිශ්‍රයෙන් ද, දකුණට ; එම ඉඩමේම ඉතිරි කොටසින්, හැරවුම් ස්ථානයෙන් සහ ලොට් 1සී දරන ප්‍රවේශ මාර්ගයෙන් ද සහ බස්නාහිරට ; බලයලත් මානක ඩබ්. ඕ. ජේ. ප්‍රනාන්දු විසින් මැන සාදන ලද 1990.08.24 දිනැති අංක 3557 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් 1බී ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටසින් ද මායිම් වූ එකී අංක 3775/බී1 දරන පිඹුර ප්‍රකාරව පර්චස් අට (අ. 0, රූ. 0, පර්. 8) ක් විශාල ඉඩම වන මෙය ගල්කිස්ස ඉඩමේ ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 2530/284 ශිර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

එකී අංක 1560 දරන උකස් බැඳුම්කරයේ උපලේඛනයේ වැඩිදුරටත් විස්තර වන මාර්ග අයිතීන්ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රාණි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

07-469/2

---

## නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී

### සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ (සංශෝධිත) 4 වන වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාවයි

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2008ක් වූ මැයි මස 21 වන දින පැවැත්වූ රැස්වීමකදී පහත සඳහන් වන අයුරු විශේෂයෙන් හා ඒකමතිකව සම්මත කරගන්නා ලදී.

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී මින් පෙර නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් (බැංකුව) නමින් කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් රුවනි රාජපක්ෂ (මහත්මිය) විසින් සහතික කරන ලද වර්ෂ 2006.04.26 දින අංක 422 දරන බැඳුම්කරය සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස් ඩී එන් ජයවර්ධන (මහත්මිය) විසින් සහතික කනර ලද වර්ෂ 2006.08.31 දින අංක 790 දරන පැවරීමේ ඔප්පුව යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, කුරුණෑගල දරන ස්ථානයේ පදිංචි අබේරත්න හේරත් මුදියන්සේලාගේ නිමල් ආරියවංශ සහ මාරසිංහ ආරච්චිලාගේ දර්ශණී සමන්තිකා සෝමරත්න (ණයට ගන්නන්) විසින් පැහැර හැර ඇති හෙයින් ද, තවද වර්ෂ 2008ක් වූ අප්‍රේල් මස 30 වන දිනට එකී බැඳුම්කරය යටතේ බැංකුවට රුපියල් හත්ලක්ෂ පනස් නමදහස් හයසිය හැත්තෑ නමය (රු.7,59,679.00) ක මුදලක් අයවිය යුතුව හා ණයව පවතින බැවින් ද, 1995 අංක 24 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධිත) පනතින් සංශෝධිත 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් (ප්‍රධාන පනත) බැංකුවෙහි අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පවරා ඇති බලතලවලට අනුව එකී රුපියල්

හත්ලක්ෂ පනස් නම දහස් හයසිය හැත්ත නමය (රු.7,59,679.00)ක මුදල සහ විකිණීම කරන අවස්ථාව වන විට නොගෙවා ඉතිරිව ඇති කවර හෝ කොටසක් ද වර්ෂ 2008ක් වූ මැයි මස 01 වන දින සිට විකිණීම කරන දින දක්වා එකී බැඳුම්කරය යටතේ රුපියල් හත්ලක්ෂ පනස් එක් දහස් පන්සිය හැත්ත එක (රු.7,51,571.00) ක මුදලක් මත වසරකට සියයට දහතුන (13%) ක පොලිය ද, ප්‍රචාරය සහ විකිණීම සඳහා දරන්නට වන වියදම් ද ප්‍රධාන පනතේ 13 වන වගන්තියට අනුව දරා ඇති වෙනත් වියදම් ද මෙතැන් සිට ලබා ගන්නා කිසියම් ගෙවීමක් (එවැන්නක් ඇත්නම්) ඇත්නම් එය ද අඩුකර ආපසු අයකර ගැනීම පිණිස එකී බැඳුම්කරය මගින් බැංකුවට උකස් කර ඇති මෙහි පහත විස්තර කරනු ලබන දේපල සහ පරිශ්‍රය ඇතුළුව සහ එහි නිදහස් අයිතිවාසිකම් සහ අනෙකුත් අයිතිවාසිකම්, හිමිකම් සහ බලපුළුවන්කාරකම් ද බලයලත් වෙන්දේසිකරු පී. කේ. ඊ. සේනාපති මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට පනතේ ඔවුන් වෙත පවරා ඇති බලතලවලට අනුව බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් මෙයින් තීරණය කරනු ලැබේ.

**ඉහත සඳහන් උකස්කර ඇති දේපල පිළිබඳ විස්තරය**

1. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දේවමැදි හත්පත්තුවේ, වල්ගම්පත්තු කෝරළේ, කෙළිමුණ ගමේ පිහිටි තල්ගහපිටියේවත්තේ හේන සහ තල්ගහපිටියේවත්ත නමින් හඳුන්වනු ලබන ඉඩමෙන් බලයලත් මිනින්දෝරු බී. ඩී, ප්‍රේමරත්න විසින් සාදන ලද වර්ෂ 2001.07.30 දින අංක 5ඒ/2001 දරන පිඹුර පරිදි මැන බෙදා වෙන් කල ලොට් 06 දරන ඉඩම් කොටසට මායිම් එනම් උතුරට : පාර (ප්‍රාදේශීය සභා) සහ මෙහි ලොට් 7න් ද, නැගෙනහිරට : මෙහි ලොට් අංක 07 සහ 08 න්ද, දකුණට 9 මෙහි ලොට් අංක 08,09 සහ 05න් සහ බටහිරට : මෙහි ලොට් 05න් ද යන මෙකී මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් පහලොවයි දශම පහයි බිංදුව (අක්කර 0, රූඩ් 0, පර්චස් 15.50) ක ඉඩම සමඟ ඒ තුල පිහිටා ඇති ගස්කොළන් වගාවන් ඇතුළු සියලු දේද වන අතර මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 1286/31 හි ලියාපදිංචි වී ඇත.

2. ඉහත පරිදි කෙළිමුණ ගමේ පිහිටි තල්ගහපිටියේවත්තේහේන සහ තල්ගහපිටියේවත්ත නමින් හඳුන්වනු ලබන ඉඩමෙන් ඉහත අංක 5ඒ/2001 දරන පිඹුර පරිදි මැන බෙදා වෙන් කළ ලොට් 07 දරන ඉඩම් කොටසට මායිම් එනම් උතුරට පාර (ප්‍රාදේශීය සභා) සහ ලොට් එක්ස් හි ඉතුරු කොටසින් ද, නැගෙනහිරට ලොට් එක්ස් හි ඉතුරු කොටසින් සහ මෙහි ලොට් 08න් ද, දකුණට මෙහි ලොට් 08 සහ 06න් සහ බටහිරට මෙහි ලොට් 06න්ද යන මෙකී මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දාහතයි දශම පහයි බිංදුවයි (අක්කර 0, රූඩ් 0, පර්චස් 17.50) ක ඉඩම සමග ඒ තුල පිහිටා ඇති ගස්කොළන් වගාවන් ඇතුළු සියලු දේ ද වන අතර මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී1286/31 හි ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරි,
නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී.

07-433/2

---

**නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී**

1990 අංක 04 දරන බැංකු මගින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ (සංශෝධිත) 4 වන වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාවයි

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2008ක් වූ මැයි මස 21 වන දින පැවැත්වූ රැස්වීමකදී පහත සඳහන් වන අයුරු විශේෂයෙන් හා ඒකමතිකව සම්මත කරගන්නා ලදී :

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී (බැංකුව) නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. ඒ. එස්. ඉලංගකෝන් (මහත්මිය) විසින් සහතික කරන ලද වර්ෂ 2005.07.04 වන දිනැති අංක 2845 දරන බැඳුම්කරය සහ වර්ෂ 2005.07.04 වන දිනැති අංක 2846 දරන අයිතිය අත්හැරීමේ ඔප්පුව සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඩී. එන්. ජයවර්ධන (මහත්මිය) විසින් සහතික කරන ලද වර්ෂ 2006.08.31 දිනැති අංක 217 දරන පවරාදීමේ ඔප්පුව යන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම දෙහිවල පදිංචි සේනක ක්ලෙමන්ට් රණසිංහ (ණයට ගන්නා) විසින් පැහැර හැර ඇති හෙයින් ද,

තවද වර්ෂ 2008ක් වූ අප්‍රේල් මස 30 වන දිනට යථෝක්ත බැඳුම්කරයන් යටතේ බැංකුවට රුපියල් දොලොස්ලක්ෂ අනූඑක්දහස් නවසිය විසිපහ (රු.12,91,925.00)ක මුදලක් අයවිය යුතුව හා ණයව පවතින බැවින් ද,

1995 අංක 24 දරන (සංශෝධිත) පනත මගින් සංශෝධනය කරන ලද 1990 අංක 4 දරන බැංකු මගින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ බැංකුවෙහි අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පවරා ඇති බලතලවලට අනුව එකී රුපියල් දොලොස් ලක්ෂ අනූඑක්දහස් නවසිය විසිපහ (රු.12,91,925.00) ක මුදල සහ විකිණීම කරන අවස්ථාව වන විට නොගෙවා ඉතිරිව ඇති කවර හෝ කොටසක් ද වර්ෂ 2008ක් වූ මැයි මස 01 වන දින සිට විකිණීම කරන දින දක්වා, එකී බැඳුම්කරයන් යටතේ මුල් මුදල වූ රුපියල් දොලොස් ලක්ෂ අසූනවදහස් තුන්සිය හතලිස් එක (රු.12,89,341.00) ක මුදල මත වසරකට සියයට දහතුන (13%) ක පොලිය ද, ප්‍රචාරය සහ විකිණීම සඳහා දරන්නට වන වියදම් ද ප්‍රධාන පනතේ 4 වන වගන්තියට අනුව දරා ඇති වෙනත් වියදම් ද මෙතැන් සිට ලබාගන්නා කිසියම් ගෙවීමක් (එවැන්නක් ඇත්නම්) ඇත්නම් එයද අඩුකර ආපසු අයකර ගැනීම පිණිස එකී බැඳුම්කරයන් මගින් බැංකුවට උකස් කර ඇති මෙහි පහත විස්තර කරනු ලබන දේපල සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකරු වන අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට පනතේ ඔවුන් වෙත පවරා ඇති බලතලවලට අනුව බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් තීරණය කරනු ලැබේ.

**ඉහත සඳහන් උකස් කර ඇති දේපල පිළිබඳ විස්තර**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ,කොළඹ නගර සභා සීමාව තුළ වූ කොළඹ 5, පාමන්කඩ, වැල්ලවත්ත, විජිත පාරේ වරිපනම් අංක 24 දරන පරිශ්‍රය එහි පිහිටි නිවසද සමග බලයලත් මානක එච්. කේ. මහින්ද විසින් සාදන ලද වර්ෂ 2005.06.01 දිනැති අංක 2526 දරන පිඹුරෙහි ලොට් 7137 දරන කහටගහවත්ත යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමෙහි බෙදා වෙන් කළ ඉඩම් කොටස උතුරට : ලොට් බී (වරිපනම් අංක 20, විජිත පාර) වලින්ද, නැගෙනහිරටː විජිත පාරෙන් ද, දකුණට : ලොට් 825 (පාර) සහ ලොට් 821 (වරිපනම් අංක 30/3 විජිත පාර) න්ද, සහ බටහිරට : ලොට් 2403 (වරිපනම් අංක 45, කල්‍යාණි පාර) මායිම් වන අතර, පිඹුරු අංක 2625 සහ 2526 ප්‍රකාරව ප්‍රමාණයෙන් පර්චස් දහනවයයි දශම පහයි බින්දුව (අ.0, රූ.0, පර්චස් 19.50)ක් වන අතර, මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වැල්ල 157/33,34 දරන වෙළුමේ/පත්ඉරුවෙහි ලියාපදිංචිවී ඇත.

අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරි,
නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී.

07-432/1

### නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී

1990 අංක 04 දරන බැංකු මගින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ (සංශෝධිත) 4 වන වගන්තිය යටතේ අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් වර්ෂ 2008ක් වූ මැයි මස 21 වැනි දින පැවැත්වූ රැස්වීමකදී පහත සඳහන් වන අයුරු විශේෂයෙන් හා ඒකමතිකව සම්මත කරගන්නා ලදී :

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී (බැංකුව) නමින් කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් රුචිනි රාජපක්ෂ (මහත්මිය) විසින් සහතික කරන ලද වර්ෂ 2005.09.19 වන දිනැති අංක 250 දරන බැඳුම්කරය සහ වර්ෂ 2005.09.19 වන දිනැති අංක 251 දරන අයිතිය අත්හැරීමේ ඔප්පුව සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඩී. එන්. ජයවර්ධන (මහත්මිය) විසින් සහතික කරන ලද වර්ෂ 2006.08.31 දිනැති අංක 498 දරන පවරාදීමේ ඔප්පුව යන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම කුරුණෑගල පදිංචි ජයකොඩි ආරච්චිලාගේ සුනිල් ජයකොඩි (ණයට ගන්නා) විසින් පැහැර හැර ඇති හෙයින් ද,

තවද වර්ෂ 2008ක් වූ අප්‍රේල් මස 30 වන දිනට යථෝක්ත බැඳුම්කරයන් යටතේ බැංකුවට රුපියල් තුන් ලක්ෂ හැත්තදහස් නවසිය අනූදෙක (රු.3,70,992) ක මුදලක් අයවිය යුතුව හා ණයව පවතින බැවින් ද,

1995 අංක 24 දරන (සංශෝධිත) පනත මගින් සංශෝධනය කරන ලද 1990 අංක 4 දරන බැංකු මගින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ බැංකුවෙහි අධ්‍යක්‍ෂ මණ්ඩලය වෙත පවරා ඇති බලතලවලට අනුව එකී රුපියල් තුන් ලක්ෂ හැත්තදහස් නවසිය අනූ දෙක (රු.3,70,992) ක මුදල සහ විකිණීම කරන අවස්ථාව වන විට නොගෙවා ඉතිරිව ඇති කවර හෝ කොටසක් ද, වර්ෂ 2008ක් වූ මැයි මස 01 වන දින සිට විකිණීම කරන දින දක්වා, එකී බැඳුම්කරයන් යටතේ මුල් මුදල වූ රුපියල් තුන්ලක්ෂ හැට නවදහස් තුන්සිය විස්ස (රු.3,69,320) ක මුදල මත වසරකට සියයට එකොලහයි දශම පහ (11.5%) ක පොළිය ද, ප්‍රචාරය සහ විකිණීම සඳහා දරන්නට වන වියදම් ද ප්‍රධාන පනතේ 4 වන වගන්තියට අනුව දරා ඇති වෙනත් වියදම් ද මෙතැන් සිට ලබාගන්නා කිසියම් ගෙවීමක් (එවැන්නක් ඇත්නම්) ඇත්නම් එයද අඩුකර ආපසු අයකර ගැනීම පිණිස එකී බැඳුම්කරයන් මගින් බැංකුවට උකස් කර ඇති මෙහි පහත විස්තර කරනු ලබන දේපල සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකරු වන අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට පනතේ ඔවුන් වෙත පවරා ඇති බලතලවලට අනුව බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් මෙයින් තීරණය කරනු ලැබේ.

#### දේපල පිළිබඳ විස්තර

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කඩගල්බොඩ කෝරලේ වැඩවිල්ලි හත්පත්තුවේ සියඹලන්ගමුව සහ පැපොලවල ගම්වල පිහිටි පැපොල්වල වත්ත යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමෙහි බලයලත් මානක ඩබ්ලිව්. සී. එස්. එම්. අබේසේකර විසින් සාදන ලද 1997 .10.07 දිනැති අංක 181/97 දරන පිඹුරෙහි ලොට් 24 ලෙස ලකුණු කර ඇති බෙදා වෙන් කළ ඉඩම් කොටස (බලයලත් මානක ඩබ්ලිව්. සී. එස්. එම්. අබේසේකර විසින් සාදන ලද 1997.09.02 දිනැති අංක 157/97 දරන පිඹුරෙහි ලොට් ඒ හි උපබෙදුමක් වන) උතුරට : ලොට් 13 (අඩි 20ක් පළල පාර) න් ද, නැගෙනහිරට : ලොට් 25 සහ 30 න් ද, දකුණට : ලොට් 41 (අඩි 20ක් පළල පාර) න් ද, සහ බටහිරට : ලොට්ස් 31 සහ 23 න්ද මායිම් වන අතර, ප්‍රමාණයෙන් පර්චස් දහය (අක්කර 0, රූඩ් 0, පර්චස් 10)ක් වන අතර, මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ1591/143 දරන වෙළුමේ/පත්ඉරුවෙහි ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්‍ෂ/ප්‍රධාන විධායක නිලධාරි,
නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී.

07-432/2

---

### නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී

නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් පීඑල්සී සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ (සංශෝධිත) 4 වන වගන්තිය යටතේ අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් වර්ෂ 2008ක් වූ මැයි මස 21 වැනි දින පැවැත්වූ රැස්වීමකදී පහත සඳහන් වන අයුරු විශේෂයෙන් හා ඒකමතිකව සම්මත කරගන්නා ලදී :

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී මින් පෙර නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් ලිමිටඩ් (බැංකු) නමින් (බැංකුව) නමින් ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. එම්. ප්‍රභා සෙනෙවිරත්න (මහත්මිය) විසින් සහතික කරන ලද වර්ෂ 2005.04.06 දින අංක 104 දරන බැඳුම්කරය සහ ප්‍රසිද්ධ නොතාරිස් අයි. ඩී. වීරක්කොඩි (මහත්මිය) විසින් සහතික කරන ලද වර්ෂ 2006.08.31 දින අංක 294 දරන පවරාදීමේ ඔප්පුව යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, නුවර දරන ස්ථානයේ පදිංචි හේරත් මුදියන්සේලාගේ සෙනෙවිරත්න බන්ඩාර (ණයට ගන්නා) විසින් පැහැර හැර ඇති හෙයින් ද, තවද වර්ෂ 2008ක්වූ අප්‍රේල් මස 30 වන දිනට එකී බැඳුම්කරය යටතේ බැංකුවට රුපියල් හත්ලක්ෂ හැට තුන් දහස් තුන්සිය පනස් නමය (රු.7,63,359) ක මුදලක් අයවිය යුතුව හා ණයව පවතින බැවින් ද, 1995 අංක 24 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධිත) පනතින් සංශෝධිත 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් (ප්‍රධාන පනත) බැංකුවෙහි අධ්‍යක්‍ෂක මණ්ඩලය වෙත පවරා ඇති බලතලවලට අනුව එකී රුපියල් හත්ලක්ෂ හැට තුන් දහස් තුන්සිය පනස් නමය (රු.7,63,359) ක මුදල සහ විකිණීම කරන අවස්ථාව වන විට නොගෙවා ඉතිරිව ඇති කවර හෝ කොටසක් ද, වර්ෂ 2008ක් වූ මැයි මස 01 වන දින සිට විකිණීම කරන දින දක්වා එකී බැඳුම්කරය යටතේ රුපියල් හත්ලක්ෂ පනස් පන් දහස් දෙසිය තිස් හතර (රු.7,55,234) ක මුදලක් මත වසරකට සියයට දොළහයි දශම පහ (12.5%) ක පොළිය ද, ප්‍රචාරය සහ විකිණීම සඳහා දරන්නට වන වියදම් ද ප්‍රධාන පනතේ 13 වන වගන්තියට අනුව දරා ඇති වෙනත් වියදම් ද මෙතැන් සිට ලබාගන්නා කිසියම් ගෙවීමක් (එවැන්නක් ඇත්නම්) ඇත්නම් එයද අඩුකර ආපසු අයකර ගැනීම පිණිස එකී බැඳුම්කරය මගින් බැංකුවට උකස් කර ඇති මෙහි පහත විස්තර කරනු ලබන දේපල සහ පරිශ්‍රය ඇතුළුව සහ එහි නිදහස් අයිතිවාසිකම් සහ අනෙකුත් අයිතිවාසිකම්, හිමිකම් සහ බලපුළුවන්කාරකම් ද බලයලත් වෙන්දේසිකරු පී. කේ. ඊ. සේනාපති මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට පනතේ ඔවුන් වෙත පවරා ඇති බලතලවලට අනුව බැංකුවේ අධ්‍යක්‍ෂක මණ්ඩලය විසින් මෙයින් තීරණය කරනු ලැබේ.

#### දේපල පිළිබඳ විස්තරය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පල්ලේගම්පහ කෝරලේ, පාතදුම්බර ප්‍රාදේශීය සභා සීමාව තුළ බොල්ලේගොඩ අඹතැන්න (මින්

පෙර පරණගම) හි පිහිටි බොල්ලේගොඩ යන නමින් හඳුන්වනු ලබන ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එච්. එම්. ටී. ආර්. විජේරත්න විසින් සාදන ලද 1996.09.20 දින අංක 896 දරන පිඹුර පරිදි මැන බෙදා වෙන් කළ ලොට් 01 දරන ඉඩම් කොටසට මායිම් එනම් උතුරට : එකී පිඹුරේ ලොට් 02න් ද, නැගෙනහිරට : එකී පිඹුරේ ලොට් 02න් ද, දකුණට : පිපීමහඅංක 1944 හි ලොට් 50න් ද සහ බටහිරට : අඹතැන්නේ සිට කොළණිය දක්වා දිවෙන පාරෙන් ද, යන මෙකී මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විස්සයි දශම හතර (අක්කර 0, රූඩ් 0, පර්චස් 20.4) ක ඉඩම වන අතර, මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එල්ඩීඕ/ඊ01/340/2005) හි ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරි,
නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී.

07-433/1

---

**මහජන බැංකුව - නුගේගොඩ ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඈ වගන්තිය යටතේ යෝජනා සම්මතය

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඈ වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.05.30 වන දින පැවැත්වූ එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කර ගත් බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

මහජන බැංකුවේ නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. එස්. ජාගොඩ මහත්මිය, විසින් සහතික කරන ලද 2005 ජූලි මස 05 වන දින අංක 5722 සහ 2006.01.09 දින අංක 6987 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු ගෙවීම් කිරීම, දිසානායක මුදියන්සේලාගේ උද්දික හර්ෂ මහතා, විසින් පැහැර හැර ඇති හෙයින්, දැන් එකී බැඳුම්කර මත රුපියල් දාහතර ලක්ෂ පනස් දහස් හත්සිය තිහයි ශත තිස් හතරක (රු.1,450,730.34) මුදලක් සහ අටලක්ෂ දහසය දහස් හයසිය හැට හයයි ශත හැත්තෑ හතරක (රු.8,16,666.74) මුදලක් මහජන බැංකුවට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇත. එබැවින් 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතින් පැවරී ඇති බලතල යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, රුපියල් දාහතර ලක්ෂ පනස් දහස් හත්සිය තිහයි ශත තිස් හතරක (රු.1,450,730.34).

එකී මුදලද 2007 දෙසැම්බර් මස 07 වන දින සිට විකිණීමේ දිනය තෙක් එම මුදල මත, වර්ෂයකට සියයට දහසයයි දශම පහක (16.5%) බැගින් පොලියද රුපියල් අටලක්ෂ දහසය දහස් හයසිය හැට හයයි ශත හැත්තෑ හතරක (රු.8,16,666.74) මුදලක් මත වර්ෂයකට සියය විසිදෙක (22%) බැගින් තවදුරටත් වූ පොලියද විකිණීමේ ගාස්තු ද, එකී මහජන බැංකු පනතේ 29ඕ වගන්තිය යටතේ අයකරගත යුතු මුදල්ද එදින තෙක් කරනු ලැබ ඇති ගෙවීම් (කිසිවක් වේ නම්) අඩු කිරීමෙන් පසු, අයකර ගැනීම සඳහා අංක 5722 හා 6987 දරන උකස් බැඳුම්කර මගින් එකී බැංකුවට උකස් කර ඇති දේපළ සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු ඊ. අර්වින් පෙරේරා මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට මෙයින් සම්මත කරනු ලැබේ.

**දේපළ සහ පරිශ්‍ර පිළිබඳ විස්තර**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා සීමාව තුළ ගංගොඩවිල ගමේ පිහිටියා වූ ද එදිරිසිංහ පාරේ වරිපනම් අංක 72/38 දරන්නාවූ ද, "ගොරකගහලන්ද" යයි කියනු ලබන ඉඩමේ බලයලත් මිනින්දෝරු ඩී. ජෝයි ද සිල්වා විසින් සාදන ලද අංක 1149 හා 1980 සැප්තැම්බර් මස 27 දින දරන පිඹුරේ ලොට් අංක 1බී ලෙස ලකුණු කොට නිරූපනය කර ඇත්තාවූ ද, ඊසාන දෙසට : ඩබ්. කරුණාරත්න හිමිකම් කියන ගොරකගහලන්ද ද, ගිණිකොණ දෙසට : ලොට් අංක 1සී සහ 1ඊ දරන කොටස ද, නිරිත දෙසට : ලොට් 1ඒ දරන කොටස ද, වයඹ දෙසට : කුඹුර ද, මායිම් වන්නාවූ එකී අංක 1149 දරන පිඹුරට අනුව පර්චස් එකොළහයි දශම හතරයි පහක් (අක්කර 0, රූඩ් 0, පර්චස් 11.45) විශාල වූ ද කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 2344/200 යටතේ ලියාපදිංචි කර ඇත්තාවූ ද බෙදා වෙන් කරන ලද මුළු ඉඩම් කොටස සහ එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි සහ වෙනත් සියලු දේත්ය.

එකී අංක 1149 දරන පිඹුරේ ලොට් අංක 1බී ලෙස ලකුණු කොට පෙන්වා ඇති ඉහත විස්තර කෙරෙන ඉඩම නැවත මැණීමකට අනුව මෙසේ විස්තර කරනු ලැබේ.

ඉහත කී ගංගොඩවිල ගමේ පිහිටියාවූ ද,

ගොරකගහලන්ද යයි කියනු ලබන ඉඩමේ බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ විසින් සාදන ලද අංක 7598බී සහ 1996 අගෝස්තු 01 වන දින දරන පිඹුරේ ලොට් බී1 ලෙස ලකුණු කොට නිරූපනය කර ඇත්තාවූ ද උතුරට : නගර සභා පාර හා ඩබ්. කරුණාරත්නගේ ඉඩම ද, නැගෙනහිරටඃ බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ විසින් සාදන ලද අංක 7598 සී දරන පිඹුරේ ලොට් 1සී දරන කොටස ද, දකුණට : බලයලත් මිනින්දෝරු ඩී. ජෝයි ද සිල්වා විසින් සාදන ලද අංක 1149 දරන පිඹුරේ (අඩි 10 ක් පළල පාර වන) ලොට් 1ඊ සහ බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ විසින් සාදන ලද අංක 7598ඒ දරන පිඹුරේ ලොට් අංක ජේ්1 ද, බස්නාහිරටඃ නගර සභා පාර ද, මායිම් වන්නාවූ ද එකී අංක 7598ඩී දරන පිඹුරට අනුව පර්චස් එකොළහයි දශම දෙකක් (අක්කර 0, රූඩ් 0, පර්චස් 11.2) විශාල වූ ද, බෙදා වෙන් කරන ලද මුළු ඉඩම් කොටස සහ එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි සහ වෙනත් සියලු දේත්ය.

පහත දැක්වෙන ඉඩම් කොටස දිගේ මාර්ග ප්‍රවේශ අයිතිය ද මීට ඇතුළත් වේ :

බලයලත් මිනින්දෝරු ඩී. ජෝයි ද සිල්වා විසින් සාදන ලද අංක 1149 හා 1980 සැප්තැම්බර් 27 දින දරන පිඹුරේ ලොට් අංක 1ඊ (අඩි 10ක් පළල පාර) ලෙස ලකුණු කර ඇත්තාවූ ද, පර්චස් දෙකයි දශම හයයි පහක් (අක්කර 0, රූඩ් 0, පර්චස් 2.65) විශාල වූ ද බෙදා වෙන් කරන ලද මුළු ඉඩම් කොටස.

ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම්2344/267 හා 2396/158 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරි,
බටහිර කලාප 11.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
(කොළඹ පිටත),
අංක 102, ස්ටැන්ලි තිලකරත්න මාවත, නුගේගොඩ.

07-471

**හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී - බණ්ඩාරවෙල ශාඛාව**
**(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2008ක්වූ මැයි මස 22 වන දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්‍ෂක මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

බණ්ඩාරවෙල ප්‍රසිද්ධ නොතාරිස් එච්. රාජපක්ෂ විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි නමට ලියන ලද්දාවූ ද, 2005.10.06 දින සහ අංක 203 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, බෝගහපතන සව්කෙන්ද මුදියන්සේලාගේ නිමල් රණතුංග යන අය ණයකරු හැටියට. පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ හැත්තෑ එක්දහස් දෙසිය හතරයි ශත හැටපහ (රු.171,204.65) ක මුදලක් 2007.10.31 දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 171,204.65 ක මුදලට 2007.11.01 වන දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩු කොට එකී අංක 203 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත උකස් කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්‍ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

**උපලේඛනය**

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, හාලි ඇල කොට්ඨාශයේ, දෙහිවිනි පළාත කෝරළේ, පේරහෙට්ටිය ගමේ පිහිටි පුරන්පම්බෙවත්ත නමින් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මානක ජී. සමරක්කොඩි විසින් 1997.04.30 දින මැන සාදන ලද අංක 2729 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 1 දරන ඉඩම් කොටසට උතුරට : ගම්සභා පාරෙන් සහ ලොට් අංක 5 න් ද, නැගෙනහිරට : ලොට් අංක 2න් ද දකුණට : ලොට් අංක 3න් සහ බටහිරට : කේ. එම්. කරුණාදාසට අයිති ඉඩමෙන් මායිම් වූ එකී අංක 2729 දරන පිඹුර ප්‍රකාරව රූඩ් එකයි පර්චස් බිංදුවයි එකයි දශම පහ (අක්කර 0, රූඩ් 01, පර්චස් 01.5) ක් විශාල ඇති ඉඩම ගොඩනැගිලි සහ එහි ඇති සියළු දේත් සමග බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 512/248 යටතේ ලියාපදිංචි කර ඇත.

මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මණ්ඩලයේ ලේකම්.

07-469/4

**හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී - බණ්ඩාරවෙල ශාඛාව**
**(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2008ක්වූ මැයි මස 22 වන දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්‍ෂක මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

බදුල්ල ප්‍රසිද්ධ නොතාරිස් එච්. රාජපක්ෂ විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි නමට ලියන ලද්දාවූ ද, 2006.10.02 දින සහ අංක 401 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ජයසිංහ කංකානම්ගේ නලින් ප්‍රියංක ජයසිංහ යන අය ණයකරු හැටියට. පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් විසිඑක්ලක්ෂ තිස්හත්දහස් නමසිය අනූහතරයි ශත විසිනමය (රු.2,137,994.29) ක මුදලක් 2007.08.31 දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු.2,137,994.29ක මුදලට 2007.09.01 වන දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩු කොට එකී අංක 401 දරන බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත උකස් කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්‍ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

**උපලේඛනය**

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, මහ පළාත කෝරලේ කීනිගම ගමෙහි උඩපෙරුව පිහිටි කුඩුගලේවත්ත (ටී. පී. 272437 කොටස) නමින් හඳුන්වන ලබන ඉඩමට බලයලත් මානක පී. ඩබ්. නන්දසේන විසින් 2006.06.01 දින මැන සාදන ලද අංක 4823 දරන පිඹුරෙන් බෙදා වෙන 'කරන ලද ලොට් ඒ දරන ඉඩමට උතුරට : ඒ. එන්. කීනිගම හිමිකම් කියන ඉඩමෙන් ද, නැගෙනහිරට: එම ඉඩමේම ඉතිරි කොටසින් සහ එච්. ඩී. ධනපාල හිමිකම් කියන ඉඩමෙන් ද සහ දකුණට : පාරෙන් ද, (ප්‍රාදේශීය සභා) සහ බටහිරට : එම ඉඩමේම ඉතිරි කොටසින් සහ එන්. ඩබ්. පතිරණ හිමිකම් කියන ඉඩමෙන් මායිම් වූ එකී අංක 4823 දරන පිඹුර ප්‍රකාරව රූඩ් එකයි පර්චස් දහය (අක්කර 0, රූඩ් 01, පර්චස් 10)ක් විශාල ඇති ඉඩම් ගොඩනැගිලි සහ එහි ඇති සියලුදේත් සමග බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජේ151/21 යටතේ ලියාපදිංචි කර ඇත.

මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මණ්ඩලයේ ලේකම්.

07-469/5

**සීමාසහිත හැටන් නැෂනල් බැංකුව - කොල්ලුපිටිය උප ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවෙහි අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2007 නොවැම්බර් මස 21 වන දින පවත්වන ලද සීමාසහිත හැටන් නැෂනල් බැංකුවෙහි අධ්‍යක්‍ෂක මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

"කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ආර්. ද සිල්වා විසින් සහතික කරන ලද්දාවූ ද සී/ස. හැටන් නැෂනල් බැංකුව නමට ලියන ලද්දාවූ ද 2006.01.09 දින සහ අංක 1708 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම සුබ්‍රමානියම් රවිචන්ද්‍රන් හෙවත් සුබ්‍රමානියම් මර්වින් රවිචන්ද්‍රන් ණයකරු හැටියට ද, පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් පන්ලක්ෂ පනස්එක්දහස් එකසිය අනූහතරයි ශත පනස් දෙකක, (රු.5,51,194.52) මුදලක් 2007.09.20 දින වන විට සීමාසහිත හැටන් නැෂනල් බැංකුවට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 5,51,194.52 ක මුදලට 2007.09.21 වන දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩු කොට එකී අංක 1708 දරන උකස් බැඳුම්කරය මගින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව වෙත උකස් කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැංකුවෙහි අධ්‍යක්‍ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී."

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුවේ, කළුගම්මනසිය පත්තුව, උල්ලන්දුපිටිය, උල්ලන්දුපිටියෙහි පිහිටි වරිපනම් අංක 93/1 දරන ඒ තුල ඇති ගොඩනැගිලි සහ සියලු දේත් සමඟ "පොල්ගස්පිටිය වලව්ව වත්ත" නමැති ඉඩමට බලයලත් මානක පී. ඩබ්. විජේවර්ධන විසින් මැන සාදන ලද අංක 5315 සහ 1997 පෙබරවාරි මස 23 වන දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් 1 ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට : පොල්ගස්පිටිය වලව්ව වත්තෙන් ද, නැගෙනහිරට සහ ගිණිකොනට : තිත්තපජ්ජල රජපිහිල්ල පාරෙන් ද, නිරිතට සහ බටහිරට : ලොට් 3 සහ 2න් ද මායිම් වූ පර්චස් තිස්තුනයි දශම හතක් (අක්කර 0, රූඩ් 0, පර්චස් 33.07) විශාල ඉඩම පිඹුරු අංක 5315 මහනුවර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එච්.615/274 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

07-469/7

**ද යූනියන් බෑන්ක් ඔෆ් කලම්බු ලිමිටඩ්**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වගන්තිය යටතේ ස්ථිර කරන ලද යෝජනා සම්මතය පිළිබඳ නොතීසිය

2007 මැයි 29 වැනි දින පැවැත්වූ රැස්වීමේ දී යූනියන් බෑන්ක් ඔෆ් කලම්බු ලිමිටඩ් (UBC) හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වගන්තිය ප්‍රකාර පහත සඳහන් යෝජනා සම්මතය ඒකමතිකව ස්ථිර කරන ලදී :

"මෙහි මින්මතුවට 'උකස්කරු' යනුවෙන් දක්වනු ඇති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, මාතර හිත්තටිය මිඩ්ල්, අකුරැස්ස පාර අංක 60 හි හේවා කිට්ටුගේ උදය ඉන්දික ජයසිංහ විසින් ඔහුගේ ජංගම ගිණුමෙන් වරින්වර ණය, අත්තිකාරම් සහ අයිරා වශයෙන් බැංකු පහසුකම් ලබාගත් බැවින් හා උකස්කරු විසින් මාතර ප්‍රසිද්ධ නොතාරිස් පී. ජී. සී. නානායක්කාර විසින් ලියා සහතික කරන ලද අංක 7079 හා 2004 සැප්තැම්බර් මස 13 වැනි දින දරන උකස් බැඳුම්කරය සහසන්කොට එකී ණය අත්තිකාරම් සහ අයිරා වෙනුවෙන් (මෙහි මින්මතුවට (UBC) යනුවෙන් දක්වනු ඇති) යූනියන් බෑන්ක් ඔෆ් කලම්බු ලිමිටඩ්ට අයවිය යුතු රු. 8,20,000 ක් සහ ඒ මත පොලිය ගෙවීම සඳහා ඇපයක් වශයෙන් මෙහි උපලේඛනයේ වඩාත් සම්පූර්ණයෙන් විස්තර කර තිබෙන දේපල උකස්කොට, යටත්කොට බැඳ තැබූ බැවින් හා ඉහත කී ණය, අත්තිකාරම් සහ අයිරා පහසුකම් වෙනුවෙන් මෙහි සඳහන් දිනය වන විට උකස්කරුගෙන් UBC ට රුපියල් දහතුන් ලක්ෂ විසි දෙදහස් හාරසිය පනස් තුනයි ශත දහතුනක (රු. 13,22,453.13) මුදලක්, 2007 මැයි 25 වැනි දින සිට වසරකට සියයට 15.5% බැගින් පොලිය අයවිය යුතුව හා ලැබිය යුතුව තිබෙන බැවින් ද,

යූනියන් බෑන්ක් ඔෆ් කලම්බු ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලය, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ ඔවුන්ට පවරා දී ඇති බලතල යටතේ කටයුතු කරමින්, උකස්කරු විසින් ඉහත කී ණය, අත්තිකාරම් සහ අයිරා ගන්වන ලද ශේෂය ගෙවීම පැහැර හැර ඇති බවට සෑහීමට පත්වී රුපියල් දහතුන් ලක්ෂ විසි දෙදහස් හාරසිය පණස් තුනයි ශත දහතුනක් (රු. 13,22,453.13) ඒ මත 2007 මැයි 26 වැනි දින සිට වසරකට 34% බැගින් පොලිය ද සමග සහ අංක 7079 දරන එකී බැඳුම්කරය, සහ 1990 අංක 04 දරන එකී පනතේ 13 වගන්තිය ප්‍රකාරව අයකර ගැනීමට UBC හිමිකම් ලබන අන් සියලු මුදල් ප්‍රමාණයන් අයකර ගැනීම සඳහා අංක 7079 දරන ඉහත කී උකස් බැඳුම්කරය යටතේ UBC ට උකස්කර තිබෙන හා මෙහි උපලේඛනයේ වඩාත් සම්පූර්ණයෙන් විස්තර කර තිබෙන දේපල 1990 අංක 04 දරන එකි පනත ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට බලයලත් වෙන්දේසිකරුවන් වන ෂොක්මන් ඇන්ඩ් සමරවික්‍රමට 1990 අංක 4 දරන එකී පනතේ 4 වගන්තිය ප්‍රකාර බලය පවරා දීමට මෙයින් සම්මත කරනු ලැබේ"

**උපලේඛනය**

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර කඩවත් සතර සහ මාතර මහ නගර සභා සීමාව තුළ හිත්තටියේ පිහිටි අකුරැස්ස පාර, වරිපනම් අංක 60 දරන බලයලත් මිනින්දෝරු එම්. සී. එම්. රෂ්මි විසින් සාදන ලද අංක 1807 හා 2003.09.20 දින දරන පිඹුරේ පෙන්නුම් කර ඇති ගොඩනැගිල්ල හෙවත් කන්දපහල හි ලොට් ඩී සහ කාරියවත්තෙහි ලොට් ඒ හි ලොට් 1 දරන ඒකාබද්ධ කරන ලද ඉඩම්වල ලොට් '1 ඩී' දරන බෙදා වෙන් කරන ලද ඉඩම් කට්ටියේ සම්පූර්ණ පස, වගාවන්, ගොඩනැගිලි සහ සෑම සියලුදේත් සමග එකී ලොට් '1 ඩී' දරන ඉඩම්

කට්ටියට මායිම් උතුරට : එම ඉඩමේම ලොට් සී සහ ලොට් එෆ් ද, නැගෙනහිරට: ගොඩැල්ලවත්ත කාරියවත්තෙහි ලොට් බී සහ කාරියවත්තෙහි ලොට් ඒ හි ලොට් 2 ද, දකුණට : අකුරැස්ස -මාතර ප්‍රධාන පාර සහ බස්නාහිරට : එම ඉඩමේම ලොට් එෆ් ද මායිම් වූ පර්චස් තිස්තුනයි දශම අටක් (අ. 0 රූ. 0 පරි. 33.8) විශාලත්වයකින් යුත් සම්පූර්ණ දේපල වන මෙය මාතර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 455/131 හි ලියාපදිංචි කර තිබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එස්. බී. එන්. එස්. කන්නන්ගර.
සමාගම් ලේකම්.

07-418

---

එන් (පීවීඑස්) 41422.

**2007 අංක 7 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ “ ඒ ඇන්ඩ් අයි ඇපරල් ට්‍රේඩිං ඇන්ඩ් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්” හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2005.04.27 දින සංස්ථාපිත සමාගමක් වන ඒ ඇන්ඩ් අයි ඇපරල් ට්‍රේඩිං ඇන්ඩ් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, ඒ ඇන්ඩ් අයි ඇපරල් ට්‍රේඩිං ඇන්ඩ් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2008 ජුනි මස 25 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

07-394

---

එන් (පීවීඑස්) 4327.

**2007 අංක 7 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ “හැනෝ ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්”හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 1988.03.10 දින සංස්ථාපිත සමාගමක් වන හැනෝ ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, හැනෝ ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2008 ජුනි මස 25 වැනි දින,
කොළඹ 10.
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

07-395

---

එන් (පීවීඑස්) 20611.

**2007 අංක 7 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ “නිමේඩ් එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ්” හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 1998.02.11 දින සංස්ථාපිත සමාගමක් වන නිමේඩ් එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, නිමේඩ් එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2008 ජුනි මස 25 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

07-396

---

එන් (පීවීඑස්) 20806.

**2007 අංක 7 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ “නිපොන් ලංකා ඉන්ටර්නැෂනල් ට්‍රේඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ”හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 1998.03.11 දින සංස්ථාපිත සමාගමක් වන නිපොන් ලංකා ඉන්ටර්නැෂනල් ට්‍රේඩ්ස් (ප්‍රයිවට්)

ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, නිපොන් ලංකා ඉන්ටර්නැෂනල් ට්‍රේඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2008 ජූනි මස 25 වැනි දින,
කොළඹ 10.
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

07-397

---

### මහජන බැංකුව - නුගේගොඩ ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඇ වගන්තිය යටතේ යෝජනා සම්මතය

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඇ වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් 2008.05.30 වන දින පැවැත්වූ එකී අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීමේදී පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කර ගත් බව මෙයින් දැනුම් දෙනු ලැබේ :

"මහජන බැංකුවේ නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. එස්. ජාගොඩ මහත්මිය, විසින් සහතික කරන ලද අංක 7073 සහ 2007 පෙබරවාරි 13 වන දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු ගෙවීම් කිරීම, ලොකු විදානගේ ඩික්සන් අජිත් ජයන්ත ගිල්බට් ද සිල්වා මහතා, විසින් පැහැර හැර ඇති හෙයින්, දැන් එකී අංක 7073 දරන බැඳුම්කර මත රුපියල් විසිඅට ලක්‍ෂ පනස් දහසක (රු. 28,50,000) මුදලක් මහජන බැංකුවට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇත. එබැවින් 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතින් පැවරී ඇති බලතල යටතේ මහජන බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින්, රුපියල් විසිඅටලක්ෂ පනස් දහසක (රු. 28,50,000) එකී මුදල ද 2007 නොවැම්බර් මස 21 වන දින සිට විකිණීමේ දිනය තෙක් ඒ මත වර්ෂයකට සියයට දහනවයයි දශම පහ (19.5%) බැගින් තවදුරටත් වූ පොලිය ද විකිණීමේ ගාස්තු ද, එකී මහජන බැංකු පනතේ 29ඕ වගන්තිය යටතේ අයවිය යුතු මුදල් ද එදින තෙක් කරනු ලැබ ඇති ගෙවීම් (කිසිවක් වේ නම්) අඩු කිරීමෙන් පසු, අයකර ගැනීම සඳහා අංක 7073 දරන උකස් බැඳුම්කරය මගින් එකී බැංකුවට උකස් කර ඇති දේපළ සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු ඊ. අර්වින් පෙරේරා මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

#### උකස් කරන ලද දේපළ සහ පරිශ්‍රය පිළිබඳ විස්තර

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා සීමාව තුළ ගංගොඩවිල ගමේ පිහිටියා වූ ද "හන්තානෙපිටියේ වත්ත" හෙවත් "කන්තනපිටියේ වත්ත "යැයි කියනු ලබන ඉඩමේ බලයලත් මිනින්දෝරු කේ. ඩී. වෝල්ටර් ඩී. පෙරේරා විසින් සාදන ලද අංක 074/2005 සහ 2005 මාර්තු 21 දින දරන පිඹුරේ ලොට් අංක 7බී ලෙස ලකුණු කොට නිරූපනය කර ඇත්තාවූ ද, කොට්ටාව 1 වන පටුමගේ වරිපනම් අංක 47 දරන්නාවූ ද, උතුරට : ලොට් අංක 7ඒ දරන කොටස සහ කොට්ටාව 1 වන පටුමගේ වරිපනම් අංක 45 දරන පරිශ්‍රය ද, නැගෙනහිරට : කොට්ටාව 1 වන පටුමගේ වරිපනම් අංක 45 සහ 47/1 දරන පරිශ්‍ර ද, දකුණට : කොට්ටාව 1 වන පටුමග වරිපනම් අංක 47/1 දරන පරිශ්‍රය සහ (අංක 1498 පිඹුරේ ලොට් බී වන) අඩි 11ක් පළල පාර ද, බස්නාහිරට : (අංක 148 පිඹුරේ ලොට් බී වන) අඩි 11ක් පලල පාර සහ ලොට් 7ඒ ද, මායිම් වන්නාවූ ද එකී අංක 074/2005 පිඹුරට අනුව පර්චස් නවයයි දශම දෙකයි පහක් (අක්කර 0, රූඩ් 0, පර්චස් 9.25) විශාල වූ ද බෙදා වෙන්කරන ලද මුළු ඉඩම් කොටස සහ එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි සහ වෙනත් සියළු දේත් ය.

පහත දැක්වෙන ඉඩම් කොටස උඩින් මාර්ග ප්‍රවේශ අයිතිය ද මීට ඇතුළත් වේ :

ඉහත කී ගංගොඩවිල පිහිටියා වූ ද, "හන්තනපිටියේවත්ත" හෙවත් "කන්තනපිටියේවත්ත" සහ "කහටගහවත්ත" යැයි කියනු ලබන ඉඩමේ ලොට් "බී" (මාර්ගය සඳහා වෙන්කිරීම) ලෙස ලකුණු කොට ඇත්තාවූ ද උතුරට: පාර සහ ලොට් 7 දරන කොටසද, නැගෙනහිරට : ලොට් අංක 7 හා 8 ද, දකුණට : ලොට් අංක 9, 10 හා ලොට් ඒ දරන කොටස ද , බස්නාහිරට: ලොට් ඒ සහ 10 දරන කෙටස් ද, මායිම් වන්නාවූ ද අංක 1498 පිඹුරට අනුව පර්චස් හතරක් (අක්කර 0, රූඩ් 0, පර්චස් 4) විශාල වූ ද, ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම්.1471/264 යටතේ ලියාපදිංචි කර ඇත්තාවූ ද මුළු ඉඩම් කොටස.

ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම්.2909/188, එම්.2864/230 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරි,
බටහිර කලාප 11.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
(කොළඹ පිටත),
අංක 102, ස්ටැන්ලි තිලකරත්න මාවත,
නුගේගොඩ.

07-470

---

### ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

(කලින් කල සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 0400000768.

ණයකරුගේ සම්පූර්ණ නම : ජොරානිස් අප්පුහාමිලාගේ නිශ්ශංක.

මහනුවර, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. අමරසිංහ, එම්. ආර්. එස්. ප්‍රනාන්දු යන අය විසින් ලියා සහතික කරන ලද අංක 14478, 992 හා 1997.12.30, 2006.09.18 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපල මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන

(2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් දෙලක්ෂ දෙදහස් නවසිය තුනයි ශත හැත්තෑදෙකක (රු.2,02,903.72) මුදලක් වර්ෂ 2007.12.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක්ලක්ෂ පනස්හත්දහස් තුන්සිය හැත්තෑනවයයි ශත තිස්තුනක (රු.1,57,379.33) මුදලද වර්ෂ 2007.12.31 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් හතළිස්පන්දහස් පන්සිය විසිහතරයි ශත තිස්නවයක (රු.45,524.39) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් දෙලක්ෂ දෙදහස් නවසිය තුනයි ශත හැත්තෑ දෙකක (රු.2,02,903.72) ද,

(2) එකී රුපියල් එක්ලක්ෂ පනස්හත්දහස් තුන්සිය හැත්තෑනවයයි ශත තිස් තුනක (රු.1,57,379.33) මුදල මත අයවිය යුතු වර්ෂයකට 17% බැගින් වන පොළියක් 2008.01.01 දින සිට දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකල හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩුකොට) ඉහත කී උකස් බැඳුම්කරය මඟින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව වෙත උකස් කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීම් (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2008ක් වූ පෙබරවාරි මස 26 වැනි දින පැවැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩුනුවර, මැදපළාත, උඩුනුවර ප්‍රාදේශීය සභා සීමාවේ, හීයාවල ග්‍රාමයෙහි පිහිටි පූජාගොඩහේන නොහොත් පූජාගොඩවත්ත ගල්කලවිටවත්ත සහ කොහිලවත්ත නමැති ඉඩමට 1977.02.08 දින ඒ. බී. කිරිදෙන මානක තැන විසින් මැන සම්පාදිත අංක 265 පිඹුර ප්‍රකාර ලොට් අංක 6බී ට මායිම්, ඊසානට : ප්‍රධාන පාර ද, ගිණිකොනට : අම්බුලේකැල්ල ද, නිරිතට : ඇළ ද, වයඹට : ලොට් 6ඒ ද යන මායිම් තුළපිහිටි පර්චස් දහසයයි දශම පහයි බින්දුවක (අක්කර 0, රූඩ් 0, පර්චස් 16.50) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියලු දේද සමග මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී296/218 හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

07-480

### ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව

(කලින් කල සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 0500000802.

ණයකරුගේ සම්පූර්ණ නම : වේවැල වලතැන්නේ සමන් රාජපක්ෂ සහ දිවනවත්තේ තලවින්නේ ගෙදර බේබිවතී නොහොත් ඩී. ටී. බේබිවතී.

මාතලේ ප්‍රසිද්ධ නොතාරිස් එස්. එම්. එම්. කොස්වත්ත විසින් ලියා සහතික කරන ලද අංක 2690 හා 2004.06.18 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපල මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් දෙලක්ෂ හතළිස් තුන් දහස් හයසිය හැත්තෑ තුනයි ශත අසූවක (රු.2,43,673.80) මුදලක් වර්ෂ 2008.02.29 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් දෙලක්ෂ දහසය දහස් විසි නවයයි ශත එකක (රු.2,16,029.01) මුදලද වර්ෂ 2008.02.29 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් විසිහත් දහස් හයසිය හතළිස් හතරයි ශත හැත්තෑ නවයක් (රු.27,644.79) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් දෙලක්ෂ හතළිස් තුන් දහස් හයසිය හැත්තෑ තුනයි ශත අසූ එක (රු.2,43,673.80) ද,

(2) එකී රුපියල් දෙලක්ෂ දහසය දහස් විසි නවයයි ශත එකක (රු.2,16,029.01) මුදල මත අයවිය යුතු වර්ෂයකට 12.5% බැගින් වන පොළියක් 2008.03.01 දින සිට දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා.

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකල හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩුකොට) ඉහත කී උකස් බැඳුම්කරය මඟින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව වෙත උකස් කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඩබ්. එම්. අයි. ගල්ලැල්ල යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීම් (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2008ක්වූ මාර්තු මස 28 වැනි දින පැවැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

උතුරු මැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, සිංහල පත්තුවේ, මැදිරිගිරිය ප්‍රාදේශීය සභා සීමාවේ දිවුලන්කඩවල ග්‍රාමයෙහි පිහිටි දිවුලන්කඩවලකැලේ නමැති ඉඩමට 1972 ජනවාරි - 1973 පෙබරවාරි

කාලයෙහි මිනුම්පති මානක තැන විසින් මැන සම්පාදිත අංක එෆ්. සී. පී. පො. 111 පිඹුරේ කැබලි අංක 158ට මායිම්, උතුරට : කැබලි අංක 117, 3 සහ 119 ද, නැගෙනහිරට : කැබලි අංක 159 ද, දකුණට : කැබලි අංක 159 සහ 4 ද, බටහිරට : කබැලි අංක 4 ද යන මායිම් තුල පිහිටි අක්කර තුනයි රූඩ් 1 යි පර්චස් තිස් හතක (අක්කර 3, රූඩ් 1, පර්චස් 37) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළු දේද, මාර්ග පරවශතාවයද සමඟ වේ. පොළොන්නරුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඉ.සං.අ.4/3/3/137 හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරි.

07-479

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව

(කලින් කල සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 0406300001.

ණයකරුගේ සම්පූර්ණ නම : අලහකෝන් අප්පුහාමිලාගේ දොන් ජයම්පති සරත් කුමාර අලහකෝන් සහ හේරත් මුදියන්සේලාගේ ධම්මිකා තෙන්නකෝන්.

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. එම්. කේ. එල්. බී. විජේකෝන්, එම්. ආර්. එස්. ප්‍රනාන්දු විසින් ලියා සහතික කරන ලද අංක 251,1005 හා 1992.12.23, 2006.10.09 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපල මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් තුන්ලක්ෂ දහඅටදහස් තුන්සිය හතළිස් අටයි ශත හැත්තෑවක් (රු.3,18,348.70) මුදලක් වර්ෂ 2007.10.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් දෙලක්ෂ හතලිස් තුන් දහස් තුන්සිය තිස්පහයි ශත පනස් දෙකක (රු.2,43,335.52) මුදලද වර්ෂ 2007.10.31 වන දින දක්වා පොලිය වශයෙන් රුපියල් හැත්තෑපන්දහස් දහතුනයි ශත දහඅටක (රු.75,013.18) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් තුන්ලක්ෂ දහඅටදහස් තුන්සිය හතළිස් අටයි ශත හැත්තෑවක (රු.3,18,348.70) ද,

(2) එකී රුපියල් දෙලක්ෂ හතළිස්තුන්දහස් තුන්සිය තිස්පහයි ශත පනස් දෙකක් (රු.2,43,335.52) මුදල මත අයවිය යුතු වර්ෂයකට 20.50% බැගින් වන පොළියක් 2007.11.01 දින සිට දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකල හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩුකොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව වෙත උකස් කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීම් (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2008ක්වූ ජනවාරි මස 10 දින පැවැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, යටිනුවර, මැද පළාත, ගිරාගම සහ අරඹේගම ග්‍රාමයේ හි පිහිටි, දෙල්ගහවත්ත නමැති ඉඩමට 1989.10.28 දින ටී. බී. අත්තනායක මානක තැන විසින් මැන සම්පාදිත අංක 1517 පිඹුර ප්‍රකාර ඉඩමට මායිම්. උතුරට : එම්. පැපොලංගට අයත් පිඹුරු අංක 522 හි ලොට් 38 ද, නැගෙනහිරට : ධර්මරත්න මහතාට අයත් පිඹුරු අංක 552 හි ලොට් 35 ද, දකුණට : ඒ. ඒ. ඩී. යූ. අලහකෝන්ට අයත් පිඹුරු අංක 552ඩී ලොට් 40 ද, බටහිරට : මෙම ඉඩමේම වෙන්කර ඇති පාරක් සමග ලොට් 43 සහ එන්. පී. එල්ඩ ප්‍රනාන්දු මානක තැන විසින් මැන සම්පාදිත පිඹුරු අංක 552 හි ලොට් 44 ද යන මායිම් තුල පිහිටි පර්චස් විස්සක (අක්කර 0, රූඩ් 0, පර්චස් 20) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළුදේද මාර්ග පරවශතාවයද සමඟ මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 343/61 හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරි.

07-478

---

## මහජන බැංකුව - මාතර උයන්වත්ත ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.03.31 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

මාතර ප්‍රසිද්ධ නොතාරිස් ටී. එන්. රූබසිංහ විසින් සහතික කරන ලද 2005.12.14 දිනැති 2977 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් මැද්දවත්ත ගමගේ ලීලාරත්න කරුණාතිලක සහ කංකානම් පතිරණගේ තිලකා කරුණාතිලක යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කර අංක 2977 යටතේ රුපියල් තුන් ලක්ෂ දෙදහස් හාරසිය හැට අටයි ශත

හැට එකක (රු.3,02,468.61) මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2007.04.18 දින සිට වර්ෂයකට සියයට දහ නවයයි දශම පහ (19.5%) බැගින් රුපියල් තුන් ලක්ෂ දෙදහස් හාරසිය හැට අටයි ශත හැට එකක (රු.3,02,468.61) මුදල සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාල මහජන බැංකු පනතේ 29ඵල් වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම්, ඒවා අඩුව රුපියල් තුන් ලක්ෂ දෙදහස් හාරසිය හැට අටයි ශත හැට එකක (රු.3,02,468.61) ක මුදල අයකර ගැනීම සඳහා මාතර බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද මහතා විසින් එකී අංක 2977 දරන උකස් කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපල හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### දේපල පිළිබඳ විස්තර

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ ගඟ බඩ පත්තුවේ, යටියන පිහිටි බිහපත්තෙගෙහේන නමැති ඉඩමේ ලොට් අංක 01 බෙදා වෙන් කළ ලොට් 1ඊ1 වඩාත් නිවැරදිව දක්වන්නේ නම් බිහපත්තෙගෙහේන ඉඩමේ උතුරු 4/3 කොටස බෙදා වෙන් කළ කේ. ජී. එස්. යාපා බලයලත් මිනින්දෝරු මහතාගේ අංක 3829 සහ 2005.08.13 දිනැති දරන ප්ලෑන ප්‍රකාර ලොට් අංක 1ඊ1 දරන බිම් කොටසට මායිම්, උතුරට සහ ඊසානට : මාතර හක්මණ ප්‍රධාන මාර්ගයද, නැගෙනහිරට : මෙම ඉඩමේම ලොට් 01 හි ඉතිරි කොටසද, දකුණ ට හා ගිණිකොණට : මෙම ඉඩමේම ලොට් 01 හි ඉතිරි කොටස ද, බටහිර සහ වයඹට : මෙම ඉඩමේම ලොට් 1ඞී1 සහ මාතර හක්මණ ප්‍රධාන මාර්ගය ද,

මායිම් වන පර්චස් විසි අටයි දශම හතයි පහක් (අක්කර 0, රූඩ් 0, පර්චස් 28.75) විශාල ඉඩම සහ ඒ තුල පිහිටි වැවිලි ගොඩනැගිලි යනාදී සියලු දෑද වේ.

මෙම ඉඩම මාතර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ සී654/137 හි ලේඛනගතව ඇත.

අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු - මාතර.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 38/1ඒ, පිට්ටනිය පාර,
මාතර.

07-473

---

## 2008.07.04 වන දින I කොටසේ පළවූ සම්මුතියේ වැරදි නිවැරදි කිරීමයි

කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. වර්ෂ 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි (ලියාපදිංචි අංක පී. කිව්. 116) අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය.

ගිණුම් අංකය : 1970004634.

ණය ගිණුම් අංක :208414 සහ 205418.

යටලමත්ත විලේගොඩ ආරච්චිගේ චන්ද්‍රලාල්.

බස්නාහිරට : කොළඹ සිට ගාල්ල දක්වා ඇති මහා මාර්ගය ද, යන මායිම් තුළ රූඩ් එකයි පර්චස් තිස් අටයි දශම පහක් (අක්කර 0, රූඩ් 01, පර්චස් 38.5) විශාල ඉඩම වේ. යනුවෙන් නිවැරදි විය යුතුයි.

ආර්. ආර්. දූනුවිල මහත්මිය,
සමාගම්/ලේකම්.

07-485

---

### මහජන බැංකුව- පූගොඩ ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඞී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඞී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් 2006.03.17 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් එස්. පී. එල්. විජේසිරිවර්ධන විසින් සහතික කරන ලද 2004.09.21 දිනැති අංක 9524 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, අඹගලගේ දොන් ජයරත්න යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් හාරලක්ෂ හැටහයදහස් හයසිය හැටඅට (රු.4,66,668) ක මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2005.06.07 දින සිට වර්ෂයකට 18.25% බැගින් රුපියල් හාරලක්ෂ හැටහය දහස් හයසිය හැටඅට (රු.4,66,668) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාල මහජන බැංකු පනතේ 29ඵල් වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් හාරලක්ෂ හැටහයදහස් හයසියහැටඅට (රු.4,66,668) ක මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. එස්. රාමනායක විසින් එකී අංක 9524 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපල හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### දේපල පිළිබඳ විස්තර

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, ගඟබඩ පත්තුවේ, ඕවිටිගම පිහිටි අළුබෝගහලන්ද නමැති ඉඩමට බලය ලත් මිනින්දෝරු කේ. එන්. ඒ. ඩබ්. සූරියආරච්චි විසින් 2003.02.17 වන දින මැන සකස් කල අංක 1687 දරන පිඹුරේ ලොට් අංක බී 1 දරන කොටසට මායිම් : උතුරු නැගෙනහිරට : අඩි 10ක් පළල පාර ද, දකුණු නැගෙනහිරට : ඇල ද, දකුණු බස්නාහිරට : පාර හා ඒ. ඩී. ජයතිස්සට අයත් ඉඩම ද, උතුරු බස්නාහිරට : ඒ. ඩී. ජයවර්ධනට අයත් ඉඩම ද යන මායිම් තුල පිහිටි රූඩ් එකයි පර්චස් හතරයි දශම පහ (අක්කර 0, රූඩ් 01, පර්චස් 4.5) ක් විශාල ඉඩම සහ එහි පිහිටි වැවිලි ගොඩනැගිලි ආදී සියළු දේත් වේ.

මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියා පදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඩී 261/285 හි ලියාපදිංචි කර ඇත.

අඩි 10ක පළල පාරක් සඳහා වෙන් කර ඇති කොටසේ මාර්ග අයිතිය ද සමඟ වේ.

අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරි,
බටහිර කලාප 111.

මහජන බැංකුව,
බටහිර 111 කලාප කාර්යාලය,
අංක 131, නුවර පාර,
බැලුම්මහර,
මුදුන්ගොඩ.

07-475

---

**පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී - පංචිකාවත්ත ශාඛාව**

1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනාව පිළිබඳ දැන්වීමයි

පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.02.27 වැනි දින පවත්වන ලද රැස්වීමකදී පහත සඳහන් පරිදි විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් යෝජනා සම්මත කර ගන්නා ලදී :—

ඔටෝවේ එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් කලින් පැන් ඒෂියා බැන්ක් ලිමිටඩ් සහ පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණු ලියාපදිංචි අංක පීකිව් 48 දරන පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට ලියන ලද ලියවිලි දෙකම ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ආර්. දොළවත්තගේ විසින් සහතික කර ඇති අංක 2257 සහ 2259 සහ දෙකම 2006 දෙසැම්බර් 28 වැනි දින දරන උකස්කර මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

එකී උකස්කර මත දැන් මුල් මුදල සහ 2007 නොවැම්බර් මස 21 වැනි දින දක්වා පොලිය වශයෙන් රුපියල් තිස්පන් මිලියන අසූහත් දහස් එකසිය හතලිහයි ශත දහසයක (රු. 35,087,140.16) මුදලක් සහ රුපියල් හතර මිලියන හය ලක්ෂයක (රු. 4,600,000) මුදල මත 2007 නොවැම්බර් මස 22 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් වර්ෂයකට සියයට විසිහය (26%) බැගින් පොලිය ද, රුපියල් දහතුන් මිලියන අට ලක්ෂයක (රු. 13,800,000) මුදල මත 2007 නොවැම්බර් මස 22 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් වර්ෂයකට සියයට විසිහය (26%) බැගින් පොලිය ද, එසේම, රුපියල් දහහතර මිලියන පන්ලක්ෂ හැත්තෑ දෙදහස් පන්සිය තිස් එකයි ශත අසූහයක (රු. 14,572,531.86) මුදල මත 2007 නොවැම්බර් මස 01 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් වර්ෂයකට සියයට තිස් අට (38%) බැගින් පොලිය ද අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

දැන් මෙයින් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ.

එකී අංක 2257 සහ 2259 දරන උකස්කරයන් මත ලැබිය යුතු වන රුපියල් තිස්පන් මිලියන අසූ හත්දහස් එකසිය හතලිහයි සත දහසයක (රු. 35,087,140.16) මුදල සහ විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් කර ඇති පරිදි පොලිය ද, ගාස්තු ද එසේම 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගතහැකි මුදල් ද අයකර ගැනීම සඳහා පී. ඒ. බී. සී. බැංකුවට උකස්කර ඇත්තාවූ ද, මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තාවූ ද, දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට නුවර, ටොරින්ටන් වීදියේ, අංක 24 දරන ස්ථානයේ බලයලත් වෙන්දේසිකරුවන් වන මෙසර්ස් ෂොක්මන් ඇන්ඩ් සමරවික්‍රම වෙත 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය පරිදි අධිකාරිය සහ බලය පවරන ලෙස

**ඉහත සඳහන් උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා සීමාවන් ඇතුළත, නාවල පිහිටි නාවල පාරේ, දැන් වරිපනම් අංක 445 දරන (බලයලත් මිනින්දෝරු තැන්පත් එස්. කුමාරස්වාමි විසින් සාදන ලද අංක 127 සහ 1959 අප්‍රේල් මස 24 වැනි දින දරන සැලැස්මේ දැක්වෙන අංක 18 දරන බිම් කැබැල්ලේ යළි මැනීමක් වන සහ බලයලත් මිනින්දෝරු තැන්පත් සිරි. ඩී. ලියනසූරිය විසින් සාදන ලද අංක 2639 සහ 1982 ඔක්තෝබර් මස 29 වැනි දින දරන සැලැස්මේ දැක්වෙන අංක 18 බිම් කැබැල්ලේ යළි මැනීමක් වන) මිල්ලගහවත්ත නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු තැන්පත් එම්. එල්. එන්. පෙරේරා විසින් සාදන ලද අංක 3551 සහ 2006 මැයි මස 28 වැනි දින දරන සැලැස්මේ නිරූපිත අංක 18 බිම් කැබැල්ල වශයෙන් ලකුණුකර බෙදා වෙන් කොට සීමා නිර්ණය කර ඇති එකී අංක 18 ලකුණු කර ඇති බිම් කැබැල්ලට මායිම් උතුරට : නාවල පාරේ වරිපනම් අංක 457/11 සහ 457/7 දරන ස්ථාන සහ මිල්ලගහවත්ත පාර, නැගෙනහිරට : නාවල පාරේ වරිපනම් අංක 457/7 දරන ස්ථානය සහ පාර, දකුණට : පාර සහ නාවල පාරේ වරිපනම් අංක 443 දරන ස්ථානය සහ බස්නාහිරට : නාවල පාරේ වරිපනම් අංක 443 සහ 457/11 දරන ස්ථානය සහ එහි ප්‍රමාණය පර්චස් විස්සක් (අ. 0, රූ. 0, පර්. 20) එම් සම්පූර්ණ බිම් කොටස එහි පිහිටි ගොඩනැගිලි සහ සියල්ල සහිතවයි.

අංක 127 දරන එකී සැලැස්මේ නිරූපිත අංක 20 බිම් කැබැල්ල මත මාර්ග අයිතිය සහිතවයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

රංජිට් පෙරේරා,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු-අයකර ගැනීම්.

07-492

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.